**වැලිමඩ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් කළ කාර්මාන්ත 02 ක එකතු වටිනාකම රු.4,788,395 ක් ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | රු.20,000,000 ක ස්ථාවර තැන්පතුවක් මුදල් කර කැප්පෙටිපොළ සතිපොළ ඉදිකිරීම් කර්මාන්තය සිදුකර තිබුණු අතර, ඉතිරිව තිබුණු රු.7,936,572 ක් ප්‍රාග්ධන ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මුද්දර ගාස්තු ආදායම රු.2,504,738 ක් අඩුවෙන් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.313,646,477ක් වූ වත්කම් විෂයන් 03 ක් සඳහා ස්ථාවර වත්කම් ලේඛන සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | උපලේඛනවලට ඇතුළත් කිරීමටත්, නව තක්සේරු වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමටත් කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ ලේඛන උපලේඛන ආදී වාර්තා මඟින් තහවුරු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 19(1) වගන්තිය | 2007 ජනවාරි සිට 2020 ඔක්තෝබර් දක්වා කාලය තුළ අනුමැතියකින් තොරව අනියම් සෞඛ්‍ය කම්කරුවන් 26 දෙනෙක් බඳවාගෙන තිබුණි. | මු.රෙ 71 ආකෘති පත්‍ර අනුව සාධාරණීකරන වාර්තා කළමනාකරණ දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇති බව. | කාර්ය මණ්ඩලය අනුමත කරවාගෙන බඳවාගත යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | | | |
| | රීති 103,104 | ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් හඳුනාගෙන තිබුණු උපකරණ ඒකක 35 ක ඌනතාවය සම්බන්ධව පරීක්ෂණ කටයුතු සිදුකර අලාභයන් අයකරගෙන නොතිබුණි. | ප්‍රින්ටර් 02 ක් සහ ප්ලාස්ටික් කුඩ 27 ක ඌනතාවය සම්බන්ධව මු.රෙ 104 අනුව කටයුතු කරන බව. | පරීක්ෂණ කටයුතු සිදුකර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මියගිය සේවකයින් 10කගෙන් අයවිය යුතු රු.217,178 ක වසර 18කට වඩා පැරණි ණය ශේෂය ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු යොදා ඇති බව. | හිඟ සේවක ණය අයකරගත යුතුය. |
| (ඈ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | | වාහන 20 ක රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම වාහනයේ පින්තාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | පින්තාරු කිරීමට මිල ගණන් කැඳවා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| | | සභාවට අයත් වාහන 15 ක ඉන්ධන දහන පරීක්ෂාව දීර්ඝ කාලයක සිට සිදු කර නොතිබුණි. | සභාව සතු වාහනවල ඉන්ධන පරීක්ෂාවක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඊ) | 2017 දෙසැම්බර් 21 දිනැති 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | දීර්ඝකාලීනව භාවිතා කරන වාහන 03 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම වාහන සභාව වෙත පවරා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන කොමසාරිස් වරයා දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 | | | |
| | 5.4.4 වගන්තිය | අනුමත සමිති වලට සුරක්ෂණයකින් තොරව උපරිමය රු.200,000ක අත්තිකාරම් මුදලක් ලබාදිය හැකි වුවත්, කර්මාන්ත 10 ක සමිති සඳහා අත්තිකාරම් ලෙස රු.223,143 සිට රු.982,910 දක්වා මුදලක් ලබාදී තිබුණි. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.87,157,490 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.95,113,331 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය |
| (i) | වරිපනම් හා බදු | 6,170,900 | 6,265,862 | 4,387,557 | 1,878,305 | 5,657,070 | 6,037,055 | 1,579,631 | 44,574,244 |
| (ii) | කුලි | 29,654,300 | 28,611,220 | 27,694,767 | 916,453 | 43,031,435 | 40,776,566 | 38,538,196 | 2,238,370 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,840,000 | 5,348,053 | 5,239,452 | 108,601 | 3,382,659 | 3,748,759 | 3,748,759 | - |
| (iv) | වෙනත් ආදායම් | 28,655,400 | 49,402,507 | 30,577,192 | 18,825,315 | 62,006,073 | 92,611,271 | 39,315,570 | 53,295,701 |
| | | -------------- | -------------- | -------------- | ------------- | -------------- | -------------- | -------------- | --------------- |
| | එකතුව | 67,320,600 | 89,627,642 | 67,898,968 | 21,728,674 | 114,077,237 | 143,173,651 | 83,182,156 | 100,108,315 |
| | | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු රු.4,363,215ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කඩ කුලී රු.1,051,442 ක් අයකරගෙන නොතිබුණි. | එම මුදල කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු රු.981,859 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.7,044,416 ක් හා මුද්දර ගාස්තු රු.45,876,700 ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ මුදල් මාසිකව අයකරමින් පවතින බව. | -එම- |

### 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා ආඥා පනතේ 172 (3) වගන්තිය අනුව 2019 වර්ෂයේදී විගණකාධිපති විසින් පනවා තිබුණු රු.764,114 ක අධිභාර 02 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද අයකරගෙන නොතිබුණි. | නඩු මඟට ගොස් අධිභාර මුදල් එකවර අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අධිභාර කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ටෙන්ඩර් කර බදු දී තිබුණු ගෝසාතකාගාර 03 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගෙන දින 14න් 14 ට අලුත් වන පරිදි තාවකාලික වෙළඳ බලපත්‍ර ලබාදී තිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇති බව. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතුය. |
| (ආ) | 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක දිවිතොටවෙල පිහිටි ආදාහනාගාරය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම් කර ඇති බව. | -එම- |
| (ඇ) | වැලිමඩ නගරයේ පොදු බස්නැවතුම්පල ආසන්නයේ පිහිටි ප්‍රාදේශීය සභාවට අයත් මාළු වෙළඳසැල්වලින් සහ ව්‍යාපාරික ස්ථාන වලින් බැහැර කරන මළ අපද්‍රව්‍ය උමාඔයට මුදා හැර තිබුණි. | අප ජලය බැහැර කිරීමට ප්‍රතිකාරක ටැංකියක් හා උරණ මලක් සැකසීමට සැලසුම් කර ඇති බව. | පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 79 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සාර්ථක ජල වහනයක් සඳහා භූගත ජල මාර්ග මඟින් ජලය බැහැර කළ යුතුය. එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂා කාලයේදී ප්‍රධාන මාර්ගයෙන් එකතුවන වැසි ජලය ප්‍රධාන බස් නැවතුම්පොලේ වෙළඳ සංකීර්ණය හරහා බැස යන බැවින් එම තත්වය වැළැක්වීමට සභාව කටයුතු කර නොතිබුණි. | කාණු පද්ධතිය විධිමත් කිරීමට පළාත් මාර්ග දෙපාර්තුමේන්තුව දැනුවත් කර ඇති බව. | අපජලය බැහැර කිරීමේ කාණු පද්ධතිය නඩත්තු කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තිය සහ 2021 ඔක්තෝබර් 21 දිනැති අංක 2251 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපනශාලා නවාතැන් පොළ වලින් ඉකුත් | ආදායම සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර අදාළ සියයට 1 ක බදු ගාස්තුව අය කර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රාදේශීය සභා පනත අනුව ආදායම් අය කරගත යුතුය. |

වර්ෂයේ ආදායමෙන් සියයට 01 ක බදු අයකළ යුතු නමුත් සභාව විසින් මේ පිළිබඳව සමීක්ෂණයක් කර ගාස්තු අය කරගෙන නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී කඩ කාමර 26 ක් බදු දීම සඳහා අවස්ථා 02කදී පුවත්පත් දැන්වීම් පළ කර තිබුණු අතර, රු.142,670 ක් වැය කර පළ කළ පළමු පුවත් දැන්වීම අනුව කඩ කාමර 09 කට ලංසු ඉදිරිපත් කර තිබුණි. කඩ කාමර වල අවම ලංසු වටිනාකම ඉහළ අගයක් ගැනීම හේතුවෙන් කඩ කාමර 17 ක් සඳහා ලංසුවක් ඉදිරිපත් කර නොතිබුණි. අවම ලංසු වටිනාකම සංශෝධනය නොකර රු.130,888 ක් වැය කර නැවත වරක් පුවත්පත් දැන්වීමක පළකර තිබුණු අතර, එකම ලංසුවක් හෝ ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කඩ කාමර 26 න් කාමර කුලී ආදායම් අහිමි වී තිබුණි. | ප්‍රසම්පාදන නොවූ දේපළ 17ක් සම්බන්ධයෙන් නැවත ප්‍රසම්පාදනය කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම සම්බන්ධයෙන් රු.130,888 ක වියදමක නිශ්කාර්ය වියදමක් නොවන බව. | ලංසු ඉදිරිපත් කළ හැකි වන පරිදි අවම ලංසු මුදල තීරණය කළ යුතු වන අතර ප්‍රතිඵල රහිත පුවත්පත් දැන්වීම් සඳහා මහජන මුදල් භාවිතා නොකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කිලෝග්රෑම් 37.5 හිස් ගෑස් සිලින්ඩර් 08 ක් සහ තණකොළ කපන යන්ත්‍ර 03 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැඟිලි 09 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇති බව. | නිවැරදිව වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ පවතින සුසාන භූමි 152 ක සහ පොදු ක්‍රීඩාංගනයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සුසාන භූමි තාවකාලික තක්සේරු කර වත්කම් ලේඛණයට ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇති බව. | සභාව සතු සියලු වත්කම් හඳුනාගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කර තිබුණු රු.584,098 ක් වටිනා වාහන සහ කරත්ත 23 ක් භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොකෙරුණි. | කරුණු සොයා බලා 2024 වර්ෂයේදී බඩු වට්ටෝරු පොත් නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කළ යුතුය. |

## 3.5 අවිධිමත් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 129 වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවට ලැබෙන සියළු මුදල් සහා අරමුදලට බැර කළ යුතු වුවද, වැලිමඩ නගරයේ පදික වෙළඳුන් සඳහා වෙළඳකුටි ඉදිකිරීමට 2020 සහ 2021 වර්ෂවල එකතු කරන ලද රු.13,725,000 ක් සභාවේ සාමාජිකයින් සිව්දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර “වැලිමඩ නගර සංවර්ධන පදික වෙළඳකුටි ඉදිකිරීම” නමින් රාජ්‍ය බැංකු ගිණුමකට බැර කර තිබුණි. | වැලිමඩ එක්සත් පදික වෙළෙඳුන්ගේ සංගමයේ කැමැත්ත අනුව ප්‍රාදේශීය සභා අරමුදලට සම්බන්ධ නොවී ගරු මන්ත්‍රීතුමන්ලා තිදෙනෙකු හා පදික වෙළෙඳ සංගමයේ නිළධාරී මහතෙකු සම්බන්ධ කර ගනිමින් රාජ්‍ය බැංකු ගිණුමක් ආරම්භ කර සියළු ගණුදෙනු එමගින් සිදු කර ඇති බව. | ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනත සහ අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් කැප්පෙටිපොල නගරයේ පිහිටි රථගාලේ රථ වාහන නවතා තැබීමේ ගාස්තු එකතු කිරීම සඳහා ප්‍රාදේශිය සභාවේ ස්ථිර සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවය කරන සේවකයෙකු යෙදවීමටත් ඒ වෙනුවෙන් වැටුපට අමතරව අයකරන රථ වාහන ගාස්තුවලින් සියයට 50 ක කොමිස් මුදලක් ගෙවීමටත් 2022 ජුනි 27 දින කළමනාකරණ කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව 2023 ජනවාරි සිට නොවැම්බර් දක්වා කොමිස් රු. 39,550 ක් සේවකයාට ගෙවා තිබුණු අතර, රථගාල් ගාස්තු අයකිරීමට අතුරු ව්‍යවස්ථා පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් වී නොමැතිවීම හේතුවෙන් ජනතාවට සිදුවන අවහිරතා මඟහැරවීමට සේවකයෙකු යොදවාගෙන ඇති බව. | මේ සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරගෙන ගාස්තු අය කිරීමට ක්‍රියා කළ යුතුය. |